සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# දේශපාලන විද්‍යාව - I

23 S I

කාලය: පැය දෙකයි

විභාග අංකය: ..................................................

උපදෙස්:-
* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20කින් යුක්ත වේ.
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුය.
* එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

## A- කොටස

* **අංක 01-15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. දේශපාලනය අධ්‍යයනය කිරීම,
    1. සාම්ප්‍රදායික අධ්‍යයන ප්‍රවේශවලට සීමා වේ.
    2. විද්‍යාත්මක සහ ප්‍රතිමානීය සලකා බැලීම් දෙකෙන් සමන්විතය
    3. ආනුභවික අධ්‍යයන ප්‍රතික්ෂේප කරයි
    4. ප්‍රායෝගිකව දේශපාලනයේ යෙදීම හා සමපාත වේ.
    5. ආරම්භ වන්නේ නූතන යුගයේ ය. (...........)

02. විද්‍යාත්මක ප්‍රවේශය,
    1. ස්වභාවික විද්‍යාවන් අධ්‍යයනයට සීමා වේ.
    2. ආරම්භ වන්නේ 20 වන සියවසේ දෙවන භාගය තුළයි
    3. ආනුභවික පර්යේෂණ මත පදනම් වූ දැනුමක් ගොඩනගයි
    4. වාස්තවික දේශපාලන දැනුමක් ගොඩනගන්නේ නැත
    5. වටිනාකම් විනිශ්චයන්ගෙන් යුක්ත වේ. (...........)

03. රාජ්‍ය,
    1. දේශපාලන ප්‍රජාවක ස්වාධිපත්‍ය මූර්තිමත් කරයි
    2. ආණ්ඩුව හා සමපාත වේ.
    3. මූලික නෛතික ව්‍යුහයක් නොමැති ආයතනයකි
    4. සමාජීය නිර්මාණයක් නොවේ
    5. ස්ථාවර ආයතනයක් නොවේ (...........)

04. ගෝලීයකරණය,
   1. රාජ්‍යයේ භෞමිකත්වය ඉතා වැදගත් කොට සලකයි
   2. අලුත් ගෝලීය ආර්ථික ක්‍රමයක් ගොඩනගමින් පවතී.
   3. ජාතික රාජ්‍ය ශක්තිමත් කරයි
   4. 'ජාතිය' යන අදහසෙහි වැදගත්කම වැඩිකරයි.
   5. දේශසීමා අර්ථවත් කරමින් බල ආධිපත්‍ය ගොඩනගයි. (...........)

05. බලපෑම් කණ්ඩායම්,
   1. ආණ්ඩු බලය දිනාගැනීමට උත්සාහ කරයි.
   2. පුරවැසි දේශපාලන සහභාගීත්වයේ අවකාශය පුළුල් නොකරයි.
   3. බල ප්‍රභූත්ව ගති ලක්‍ෂණ පෙන්නුම් නොකරයි.
   4. ප්‍රජාතන්ත්‍රවාදී නොවන සමාජ ක්‍රමවල ද ක්‍රියාත්මක ය.
   5. ආණ්ඩුවේ තීරණ, ප්‍රතිපත්ති ආදියට බලපෑම් කරයි. (...........)

06. සන්ධීය ආණ්ඩු ක්‍රමය,
   1. ඒකමාණ්ඩලිකවාදය මත පදනම් වේ.
   2. ස්වායත්ත ආණ්ඩු මට්ටම් දෙකකින් සමන්විතය.
   3. ප්‍රාදේශීය ස්වාධීනත්වය හෝ ජාතික එක්සත්කම යන අරමුණු දෙකෙන් එකක් ඉටුකරගැනීමට යාමේ ප්‍රතිඵලයකි.
   4. කාර්යක්‍ෂම ආණ්ඩු ක්‍රමයකි.
   5. ව්‍යවස්ථාව උත්තරීතරත්වයෙහි ලා සැලකීම අනිවාර්ය නොවේ. (...........)

07. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය තුළ,
   1. රාජ්‍ය නායකයා ඍජු ලෙසින්ම තෝරාපත් කරයි.
   2. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පැහැදිලි බෙදීමක් නිර්මාණය කරයි.
   3. විධායකය ව්‍යවස්ථාදායකයට වග නෙකියයි.
   4. අගමැතිවරයා, පාර්ලිමේන්තු සාමාජිකයන් අතුරින් කැබිනට් මණ්ඩලය තෝරා පත් කරයි.
   5. රාජ්‍ය නායකයා වන්නේ අගමැතිවරයාය. (...........)

08. සමූහාණ්ඩුවාදය සම්බන්ධයෙන් අදාල නොවන්නේ,
   1. පුරවැසිභාවය යනු රාජ්‍යයේ / දේශපාලන ප්‍රජාවේ සාමාජිකත්වය ලබා ගැනීමයි.
   2. නිදහස පුරවැසියන් අරගල මගින් සාක්ෂාත් කරගත යුතු දෙයකි.
   3. රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් පත්කරගත යුතුය.
   4. පරමාධිපත්‍ය බලයේ හිමිකරු මහජනතාවයි.
   5. මෙය රාජාණ්ඩුවාදයට එක හෙලා විරුද්ධය. (...........)

09. ජාතිකවාදය,
   1. නිශ්චිත චින්තකයෙකු හෝ දාර්ශනිකයෙකු සමඟ අනන්‍ය වී ඇත.
   2. දාර්ශනික වශයෙන් පොහොසත්ය.
   3. ප්‍රවේශ දෙකක් යටතේ හඳුනාගත හැක.
   4. නූතන ලෝකයේ රාජ්‍ය, දේශපාලන ගැටුම් සහ අන්තර් රාජ්‍ය සම්බන්ධතා නිර්ණය කිරීමට බලපෑ ප්‍රධාන සාධකයකි.
   5. දේශපාලන ව්‍යාපාරයක් නොව දේශපාලන මතවාදයක් පමණි. (...........)

10. ගැටුම් සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,
   1. ගැටුම්වල ඇත්තේ නිශේධනීය පැතිකඩක් පමණි.

2. ගැටුමක් යුද්ධයකින්ම කෙළවර විය යුතුය.
3. ගැටුම් ජීවන චක්‍රය ක්‍රිස්ටෝෆර් මිචෙල් විසින් ඉදිරිපත් කොට ඇත.
4. සාකච්චා මාර්ගයෙන් පමණක් ගැටුම් නිරාකරණය කල හැකිය.
5. එකිනෙකා අතර ඇති සමනය කල නොහැකි අරමුණු හා අභිලාෂ මත ගැටුම් ඇති වේ.

(...........)

11. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය,
1. සමාජවාදී ආණ්ඩුවලට විකල්පයක් ලෙස ඉදිරිපත් විය
2. 17 සහ 18 වන සියවස්වලදී පළමුව ආසියාවේ බිහි වී වර්ධනය විය.
3. මෙහිදී ජනතාව සෘජුවම දේශපාලනයට සම්බන්ධ වේ.
4. ප්‍රජාතන්ත්‍රවාදයේ සීමිත සහ වක්‍ර ස්වරූපයයි.
5. රාජ්‍ය සහ සිවිල් සමාජය අතර වෙනසක් ඇති නොකරයි. (...........)

12. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය සම්බන්ධයෙන් අදාල නොවන්නේ,
1. දේශපාලන පක්ෂ වර්ධනය ආරම්භ වූයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දීය.
2. ලංකාවේ දේශපාලන පක්ෂ බිහිවීම නියෝජන ක්‍රමය සහ ඡන්ද බලය පසුබිම් කොටගෙන සිදුවූවකි.
3. ලංකා සම සමාජ පක්ෂය ප්‍රථම සංවිධානාත්මක දේශපාලන පක්ෂයයි.
4. වර්තමානයේදී ක්‍රියාත්මක වන්නේ අධිපති ද්වී පක්ෂ සහිත බහු පක්ෂ ක්‍රමයකි.
5. ආරම්භයේ පටන් වර්තමානය දක්වාම මෙරට වාමාංශික පක්ෂ දේශපාලනය තුළ තම ජනප්‍රියතාවය රැකගැනීමට සමත්ව ඇත.

(...........)

13. ඉන්දියානු ආණ්ඩුක්‍රමය,
1. ලෝකයේ කෙටිම ව්‍යවස්ථාවට හිමිකම් කියයි.
2. ප්‍රාන්ත රාජ්‍ය 27කින් යුක්ත වේ.
3. ප්‍රාන්ත රාජ්‍ය පාලනය කිරිමේ හා විසුරුවා හැරීමේ බලය මධ්‍යම රජයට ලබා දී ඇත.
4. සමමිතික බල බෙදීමක් සහිතය.
5. සන්ධියත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෘජුවම ප්‍රකාශ කර ඇත . (...........)

14. රාජ්‍ය ප්‍රතිපත්ති,
1. නිර්මාණය කිරිම මෙන්ම ක්‍රියාවට නැංවීම ද දේශපාලඥයාගේ කාර්යභාරයකි.
2. සම්බන්ධයෙන් වර්තමානයේ ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය ශීඝ්‍රයෙන් කප්පාදු වෙමින් පවති.
3. දේශපාලන පක්ෂවල බලපෑමෙන් සපුරා නිදහස් ය.
4. මහජන දුක්ගැනවිලි නිරාකරණය පිළිබඳ සැලකිලිමත් නොවේ.
5. සම්බන්ධයෙන් අධිකරණයේ කාර්යභාරය සීමාසහිතය. (...........)

15. ''රටක ආණ්ඩුවක් ප්‍රතෂ්ඨාපනය කරන්නා වූත්, ආණ්ඩුවක් මෙහෙයවන්නා වූත් රීති සමූහයේ එකතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි'' යනුවෙන් දක්වා ඇත්තේ,
1. ඇරිස්ටෝටල් ය 2. කේ.සී. වියර් ය 3. සී.එෆ්.ස්ට්‍රෝන්ය.
4. බ්‍රයිස් සාමි ය 5. ජෝන් ලොක් ය

(...........)

* **16-25 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.**

16. යටත්විජිත පාලන අවධියේ ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණ ඇතුළත් වරණය වන්නේ,
A- දේශීය ධනපති පංතියක සම්භවය.
B- සමාජ කණ්ඩායම්වල උඩුකුරු සමාජ සචලතාවය.

C- රාජකාරි ක්‍රමය අහෝසි කිරිම.
D- ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම.
E- රටේ පරිපාලන කටයුතු මධ්‍යගත කිරීම.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

17. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව නිවැරදි වන්නේ,

A- නියෝජන සංකල්පය හඳුන්වාදුන්නේ ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගිනි.
B- 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයෙන් සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදි.
C- 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දෙන ලදි.
D- වාර්ගික නියෝජනය ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් අහෝසි කරන ලදි.
E- මෙරට මුලින්ම ව්‍යවස්ථාදායක සභාවක් ආරම්භ කලේ 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මගිනි.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

18. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ,

A- මෙරට ජනතාවට සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දෙන ලදි.
B- දේශීය නායකයන්ට පූර්ණ වගකීමක් ප්‍රදානය කරන ලදි.
C- සමාජ සජීවිකරණය වේගවත් විය.
D- සමාජ සුභසාධනය ආරම්භ විය.
E- මෙරට දේශපාලන පක්ෂවල ආරම්භය සිදු විය.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

19. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමයේත්, සෝල්බරි ආණ්ඩුක්‍රමයේත්, පවතින සමාන ලක්ෂණ ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

A- ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට හිමිවීම.
B- ලිඛිත හා අනම්‍ය ව්‍යවස්ථාවක් පැවතීම.
C- පාර්ලිමේන්තුවට වගකියන කැබිනට් මණ්ඩලයක් පැවතීම.
D- කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමය මත පදනම් වීම.
E- ආණ්ඩුව පාර්ලිමේන්තුව මගින් පාලනය කිරිම

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

20. සෝල්බරි ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් අදාල වන්නේ,

A- නාමික විධායකය අග්‍රාණ්ඩුකරු විය.
B- රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් නිර්මාණය කරන ලදි.
C- පාර්ලිමේන්තු ස්වාධිනත්වය නොයෙක් කරුණු වලින් සීමා කරන ලදී.
D- ව්‍යවස්ථාවේ අන්තර්ගත වූයේ සුලු ජන අයිතිවාසිකම් පමණි.
E- අවසාන අභියාචනාධිකරණ බලය හිමිවූයේ ශ්‍රේෂ්ඨාධිකරණයටයි.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

21. 1972 ආණ්ඩුක්‍රමය යටතේ,

A- පාර්ලිමේන්තු පරමාධිපත්‍ය ක්‍රියාත්මක විය.
B- අධිකරණ සේවයේ ස්වාධීනත්වය සඳහා ආයතන දෙකක් නිර්මාණය කරන ලදී.
C- පනත්වලට අවසාන අනුමැතිය ලබාදුන්නේ ජනාධිපතිවරයාය.
D- ව්‍යවස්ථාදායකය ඒක මාණ්ඩලික විය.
E- රාජ්‍ය සේවය දේශපාලනීකරණය විය.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

22. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා,

A- ආණ්ඩුවේ ප්‍රධානියා වේ.

B- අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය පත්කරයි.
C- පාර්ලිමේන්තුව, විසුරුවා හැරීමේ බලය ඇත.
D- කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා නොවේ.
E- පස් අවුරුදු නිලකාලයකට හිමිකම් කියයි.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

23. 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය,

A- ව්‍යවස්ථා විවරණ බලය හිමිකරගනී.
B- අවසාන අභියාචනාධිකරණ බලය දරයි.
C- මූලික නීතිය යටතේ පිහිටුවා ඇත.
D- උපදේශාත්මක අධිකරණ බලය හිමිකරගනී.
E- සමන්විත වන්නේ අගවිනිසුරු සහ තවත් විනිසුරුවන් 6-10 ත් අතර ප්‍රමාණයකින්ය.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

24. පළාත් සභා ක්‍රමය,

A- ඉන්දු ලංකා ගිවිසුමේ ප්‍රතිඵලයකි.
B- ජනවාර්ගික අර්බුදයට විසඳුමක් ලෙස පිහිටුවන ලදි.
C- මධ්‍යම ආණ්ඩුව හා පළාත් පාලන ආයතන අතර පිහිටි නව ආණ්ඩු බල ආයතනයකි.
D- පළාත් මහ ඇමති විසින් ආණ්ඩුකාරවරයා පත්කරයි.
E- ව්‍යවස්ථා සංශෝධනයකින් තොරව අහෝසි කළ නොහැකිය.

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

25. ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය නොවන ක්‍රියාධරයින් වන්නේ,

A- අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන
B- බහුජාතික සමාගම්
C- කීර්තිමත් පුද්ගලයින්
D- ත්‍රස්තවාදී කණ්ඩායම්
E- ජාතික රාජ්‍ය

1. ABCD 2. ABDE 3. ACDE 4. BCDE 5. ABCE

(...........)

- **අංක 26-30 දක්වා ඇති සෑම ප්‍රශ්නයකටම ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත . එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන 1,2,3,4,5 යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5. | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි |

| ප්‍රශ්න අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 26. | සෝල්බරි පාර්ලිමේන්තුව ආයතන තුනක එකතුවෙන් නිර්මාණය විය. | අග්‍රාණ්ඩුකාරවරයා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය එකී ආයතන තුනයි. (...........) |
| 27. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය 1972 ආණ්ඩුක්‍රමයේ නවාංගයක් විය | ව්‍යවස්ථා විවරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට හිමි විය. (...........) |

| | | |
|---|---|---|
| 28. | 1978 ව්‍යවස්ථාවට ගෙනෙන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයාගේ බලතල වැඩිකරන ලදි. | 19 වන සංශෝධනය යටතේ ජනාධිපති සතු බලතල අවප්‍රමාණ කරන ලදි. (...........) |
| 29. | ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති විධිමත් ලෙස ක්‍රියාත්මක වන්නේ නිදහස ලබාගැනීමට පසු යුගයේ දිය. | ලංකාවේ මෑත කාලීනව බලයට පත් වූ ආණ්ඩු ආසියාවට යොමු වූ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. (...........) |
| 30. | ශ්‍රී ලංකාව 1950 වර්ෂයේ සිට පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජිකත්වය දරයි. | 23 වන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව (CHOGM) 2013 දී ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි. (...........) |

## B කොටස

31. 'දේශපාලනය හැදෑරීම' යන අදහසෙහි අර්ථ කිහිපයක් තිබේ. ඉන් දෙකක් දක්වන්න.
    1. ................................................................................................................................
    2. ................................................................................................................................

32. පහතින් විස්තර වන අධ්‍යය ප්‍රවේශ මොනවාදැයි නම් කරන්න.
    1. දේශපාලනය අධ්‍යයනය සඳහා මුලින් ම යොදාගත් දීර්ඝකාලීන පැවැත්මක් ඇති අධ්‍යයන ප්‍රවේශය
       ................................................................................................................................
       ................................................................................................................................
    2. දේශපාලන විද්‍යාවත් සමාජ විද්‍යාවත් අතර සබඳතාවය තුලින් ගොඩනැගුණකි.
       ................................................................................................................................
       ................................................................................................................................

33. දේශපාලන විද්‍යාවේ 'න්‍යාය' යන සංකල්පයට අර්ථ දෙකකි. ඒ මොනවාද?
    1. ................................................................................................................................
    2. ................................................................................................................................

34. ලෝකයේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ ක්‍රම 02ක් දක්වන්න.
    1. ................................................................................................................................
    2. ................................................................................................................................

35. රාජ්‍ය මනුෂ්‍ය සමාගම් අතර ඉහළම සංවිධානය වන්නේ ය' යන ප්‍රකාශයට අර්ථ දෙකක් ඇත. ඒ මොනවාද?
    1. ................................................................................................................................
    2. ................................................................................................................................

36. පහතින් විස්තර වන රාජ්‍ය මාදිලි නම් කරන්න.
    1. දේශපාලනය සම්බන්ධයෙන් සචේතන වූ ප්‍රථම රාජ්‍ය ක්‍රමයයි.
       ................................................................................................................................
    2. යුරෝපීය යටත් විජිත බලවේගවල ඍජු බලයට යටත්ව සිටි යුරෝපීය නොවන සමාජවල වර්ධකය වූ රාජ්‍ය මාදිලියයි.
       ................................................................................................................................

37. ස්වාධිපත්‍ය සංකල්පය අභියෝගයට ලක්කරන කරුණු දෙකක් දක්වන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

38. ඒකීය ආණ්ඩුක්‍රමයක මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ආකාර 3කි. ඉන් දෙකක් දක්වන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

39. ඉන්දීය ආණ්ඩුක්‍රමයෙහි දැක්වෙන හදිසි අවස්ථා වර්ග තුනෙන් දෙකක් දක්වන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

40. ස්ත්‍රීවාදයේ ප්‍රධාන ධාරා 2ක් දක්වන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

41. ගැටුම් පිළිබඳ සරල වර්ගීකරණයේ ආකාර 2ක් ලියන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

42. ලෝක ඉතිහාසය ගවේෂණය කිරීමේදී යටත් විජිත බිහි වූ ආකාර දෙකක් හඳුනාගත හැකිය. එම ආකාර දෙක සඳහන් කරන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

43. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සුළුජන අයිතවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යොදාගත් විධිවිධාන දෙකක් සඳහන් කරන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

44. 1931 සහ 1972 ආණ්ඩුක්‍රම යටතේ ව්‍යවස්ථාදායකය හැඳින්වූ නම් පිළිවෙළින් ලියන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

45. 'සීමිත ආණ්ඩුව' යන සංකල්පයේ ලක්ෂණ දෙකක් නම් කරන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

46. වත්මන් ව්‍යවස්ථාවට කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දී බලතල විමධ්‍යගත කිරීම ලැයිස්තු තුනක් යටතේ සිදුකර ඇත. ඉන් දෙකක් දක්වන්න.
    1. ..........................................................................................................................
    2. ..........................................................................................................................

47. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය තීරණය කිරීම සඳහා බලපාන්නා වූ සාධක ගණනාවකි. ඉන් දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

48. ලංකාවේ බිහි වූ පූර්ව පක්ෂ දේශපාලන සංවිධාන දෙකක් නම් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

49. වත්මන් අධිකරණයේ ස්වාධීනත්වය බහුමානීය සංකල්පයකි. එය කොන්දේසි කිහිපයකින් සමන්විත වෙයි. ඉන් දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

50. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මෙරට ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා ගෙන ඇති විධිවිධාන 2ක් සඳහන් කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# දේශපාලන විද්‍යාව - II

23 S II

කාලය: පැය තුනයි

විභාග අංකය: ..................................................

උපදෙස්:-
* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.
* I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද IIIකොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

01. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය ඔබ දකින්නේ කෙසේද? විස්තර කරන්න. **(ල.20)**

02. ජනාධිපති ආණ්ඩුක්‍රමය, හා කැබිනට් ආණ්ඩුක්‍රමය පිලිබඳ තුලනාත්මක විග්‍රහයක් කරන්න. **(ල.20)**

03. පහත මාතෘකා වලින් ඕනෑම දෙකක් විස්තර කරන්න.

    i. රාජ්‍ය හා පුරවැසියා
    ii. තුලනාත්මක අධ්‍යයන ක්‍රමය
    iii. රාජ්‍ය හා ස්වාධිපත්‍ය
    iv. විද්‍යාත්මක (චාර්යාවාදී) ප්‍රවේශය (ල.10x2 =20)

## II කොටස

04. ශ්‍රී ලංකාවේ සිදු වූ යටත්විජිත පරිවර්තනයේ ආර්ථික හා සමාජ පැතිකඩ සාකච්ඡා කරන්න. **(ල.20)**

05. සෝල්බරි ආණ්ඩුක්‍රමයට අදාලව පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

    i. සුළු ජාතින්ගේ ආරක්ෂාව සඳහා යොදා තිබූ විධිවිධාන
    ii. නාමික විධායකය
    iii. රාජ්‍ය සේවය (ල.10x2 =20)

06. '1972' ආණ්ඩුක්‍රමය යටතේ ව්‍යවස්ථාදායකයට පාර්ලිමේන්තු පරමාධිපත්‍ය බලය හිමිවිය' සාකච්ඡා කරන්න. **(ල.20)**

07. 1978 ආණ්ඩුක්‍රමය යටතේ පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් සාකච්ඡා කරන්න.

i. ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ක්‍රමය

ii. ජනාධිපතිවරයා, නීති සම්පාදන ක්‍රියාවලිය හා පාර්ලිමේන්තුව

iii. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

iv. අධිකරණ ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය සහ භාවිතය (ල.10x=20)

## iii කොටස

08. ඇමරිකානු ආණ්ඩුක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ විස්තර කරන්න. (ල.20)

09. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් විස්තර කරන්න.

i. ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය අතර වෙනස්කම්

ii. ලංකාවේ දේශපාලන පක්ෂවල ආරම්භය හා වර්ධනය

iii පළාත් සභා ක්‍රමය

iv. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ සමකාලීන ප්‍රවනතා (ල.10x2=20)

10. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.

i. ජාතික බලය සහ ජාතික අභිලාෂ

ii. බලපෑම් කණ්ඩායම්

iii. ගෝලීයකරණය සහ රාජ්‍ය

iv. බලතල බෙදීම

v. ප්‍රතිපත්ති ක්‍රියාදාමය (ල.10x2 =20)